DOI : 10.31357/fhssmst.1996.00682

# ශ්‍රී ලංකාවේ පුනරුත්ථාපන නව උපාය මාර්ග පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්

# ශ්‍රී ලංකාවේ පුනරුත්ථාපන නව උපාය මාර්ග පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්

නම : කේ. කරුණාතිලක

ලියාපදිංචි අංකය : ඒ. 17215

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
ශාස්ත්‍රපති උපාධි (සමාජ විද්‍යාව) පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධය

1996

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය.

# A Sociological Explanation on New Rehabilitation Methods in Sri Lanka


Name : K. Karunathilake

Registered No : A. 17215


**Independent Thesis for**

**M. A. Degree (Sociology)**

**of The University of Sri Jayawardenapura**

**1996**


**Department of Sociology**

**University of Kelaniya**

**Kelaniya.**

# කර්තෘගේ ප්‍රකාශය

"මෙම පර්යේෂණ නිබන්ධනය මා විසින් ස්වාධීන ව නිම කරන ලද්දක් බවත්, මාගේ අදහස්වලට පරිබාහිර සියලු තොරතුරු දැක්වීමේ දී ඒ පිළිබඳ මූලාශ්‍ර සඳහන් කර ඇති බවත්, මෙම නිබන්ධනය හෝ එහි කොටසක් වෙනත් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කර නොමැති බවත් සහතික කරමි. එසේ ම මෙම පර්යේෂණ නිබන්ධය මහාචාර්ය සන්දසේන රත්නපාල මහතා සහ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු පී.එල්.එම්. ද සිල්වා මහතා යන අයගේ උපදේශකත්වයෙනුත්, පූර්ණ අධීක්ෂණය යටතේත් සම්පාදනය කරන ලද්දක් බව සඳහන් කරමි."

කේ. කරුණාතිලක

# උපකාරානුස්මෘතිය

මෙම පශ්චාද් උපාධි පර්යේෂණ කාර්යය සාර්ථක ව නිම කර ගැනීමෙහි ලා උපකාර කළ මාගේ ගුරුභවතුන් හා හිතමිතුරු සමූහය මෙහි දී සිහිපත් කිරීම මගේ යුතුකමක් ලෙස සලකමි. මෙම පර්යේෂණ ක්‍රියාවලියේ දී අවශ්‍ය උපදෙස් ලබා දෙමින් මා දිරිමත් කළ, එසේ ම ප්‍රධාන උපදේශක වශයෙන් ක්‍රියා කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය නන්දසේන රත්නපාල මහත්මා ඉතාමත් භක්තිපූර්වක ව සිහිපත් කරමි. මාගේ පර්යේෂණයට අදාළ නීතිමය ක්ෂේත්‍රය සහ එහි ප්‍රායෝගික අංශය පිළිබඳ ව මනා අවබෝධයකින් යුක්තව මා හට උපදෙස් ලබා දුන් විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු පී.එල්.එම්. ද සිල්වා මහත්මා ද , ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය සඳහා ලියාපදිංචි විමේදීත්, එහි කටයුතු නිමවන අවස්ථාවේදීත් සමාජ විද්‍යා හා සමාජ මානව විද්‍යා අධ්‍යනාංශයේ අංශාධිපති වශයෙන් ක්‍රියාකරන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එඩ්වින් සේ. ගණිහිගම මහතා ද සිහිපත් කරනුයේ ඉතා ගෞරවයෙනි. එසේ ම අවශ්‍ය හැම විට ම මා හට උපදෙස් ලබා දෙමින් ක්‍රියා කළ සමාජ විද්‍යා හා සමාජ මානව විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටෙනිසන් පෙරේරා මහත්මාත්, කථිකාචාර්ය ධනපාල විජේසිංහ මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීනුත් ස්තුති පූර්වක ව සිහිපත් කරමි.

මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය ලිඛිත මූලාශ්‍ර සපයා ගැනීමේ දී මා හට උපකාර කළ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස් එච්.පී. ධර්මදාස මහත්මාත්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පුස්තකාලයාධිපතිනිය ඇතුළු එම කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙමි. පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ වතුපිටිවල තරුණ වරදකරුවන් පුහුණු කිරීමේ පාසැල සතු දත්ත ලබා දෙමින් උපකාර කළ එම ආයතන අධ්‍යක්ෂ ටී.ඒ ආරියසේන මහත්මාටත්, නිවාසපති රාජනායක මහත්මා ඇතුළු ආයතනයේ කාර්ය මණ්ඩලයත් එම ආයතනයේ පුනරුත්ථාපනය වූ සහ සමාජගත ව සිටි නේවාසිකයන් සමූහයත් මෙහි දී සිහිපත් කළ යුතු ය. ඔවුන්ගේ සහයෝගය නොලැබුණේ නම් මෙම පර්යේෂණය සාර්ථක කර ගත හැකි නොවනු ඇත. ඔවුන් සැම දෙනාට ම ස්තුතිවන්ත වෙමි.

සමාජගත නේවාසිකයන් සොයා යාමේ දී මා හට උපකාර කළ කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටී.පී. උභයචන්ද්‍ර මහතාත්, මහනුවර මල්වතු විහාර පාර්ශවයේ මාත්නමුව පන්සලේ ලක්පාන චන්දවිමල හිමියන් ද, දඹුල්ල ගල්කිරියාගම උඩෙසේකර දිසානායක මහතා සහ මාතර වැලිගම ගුණතිලක මහත්මාත් දැක් වූ උනන්දුව හා කැපවීම කිසිවිටෙක දී අමතක නොවේ. ඔවුන් සියලුදෙනාට ම මාගේ ස්තුතිය ප්‍රකාශ කරමි.

ශාස්ත්‍රීය කටයුතු සඳහා අවශ්‍ය සෑමවිට ම උපදෙස් ලබා දෙමින් මා දිරිගැන් වූ කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යනාංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්,ඩබ්ලිව්. කරුණාරත්න මහත්මා ගෞරවයෙන් සිහිපත් කරමි. එසේ ම ආචාර්ය මණ්ඩලයේ සුභාෂිණි, සිසිර, ගීතානි ඇතුළු මා හිතවත් මහත්ම මහත්මීන් ලබා දුන් සහයෝගය ද අගය කරන්නෙමි. නිබන්ධනයේ ව්‍යාකරණ දෝෂ සෑහෙන දුරට නිදොස් කර දීමට කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යනාංශයේ කථිකාචාර්ය සුසන්ත මහැල්පත මහතා උපකාරි විය.

මෙම පරියේෂණයේ සියලු කටයුතුවල දී අවශ්‍ය යතුරු ලියන කටයුතු නිම කරමින් සහයෝගය දැක් වූ ශිරාණි, වසන්ති සහ සමිතා යන මෙනෙවියන්ටත්, පරිගණක යන්ත්‍රය මෙහෙයවීමෙන් පරියේෂණයේ අවසාන පිටපත් සකස් කර දුන් බන්දුල අටුපොළගේ මහතාටත් මාගේ ස්තුතිය පිරිනමමි.

මෙවන් ශාස්ත්‍රීය කටයුත්තක් සඳහා අවශ්‍ය පරිසරය සකස් කර දුන් මා බිරිඳ ජේපාලිත්, පුතු මාලිංගත් අවසාන වශයෙන් සිහිපත් කරමි.

කේ. කරුණාතිලක

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. පළමු පරිච්ඡේදය | | 01-16 |
| 1. | පර්යේෂණ මාතෘකාව | 02 |
| 1.1. | පර්යේෂණයේ වැදගත්කම | 02 |
| 1.2 | පර්යේෂණ ගැටළුව සහ පරමාර්ථ | 04 |
| 1.3 | මූලාශ්‍ර භාවිතය සහ ක්‍රමවේදය | 08 |
| 1.4 | දත්ත විශ්ලේෂණය | 15 |
| 2. පරිච්ඡේදය | | 17-44 |
| 2. | අපරාධය යනු කුමක්ද? | 18 |
| 2.1 | අපරාධ නීතිය සහ දඬුවම් ක්‍රම | 27 |
| 3. පරිච්ඡේදය | | 45-64 |
| 3. | බාලාපරාධය යනු කුමක්ද? | 46 |
| 3.1 | බාලාපරාධ හා සම්බන්ධ න්‍යායයන් | 54 |
| 4. පරිච්ඡේදය | | 65-95 |
| 4. | පුනරුත්ථාපනය යනු කුමක්ද? | 66 |
| 4.1 | පුනරුත්ථාපනයේ ඓතිහාසික පසුබිම | 72 |
| 4.2 | ශ්‍රී ලංකාවේ පුනරුත්ථාපන ක්‍රියාවලිය සහ එහි ඓතිහාසික පසුබිම | 79 |
| 4.3 | පුනරුත්ථාපනය පිළිබඳ බෞද්ධ විග්‍රහය | 87 |
| 5. පරිච්ඡේදය | | 96-106 |
| 5. | වතුපිටිවල තරුණ වරදකරුවන් පුහුණු කිරීමේ පාසැල | 97 |

6. පරිච්ඡේදය 107-139

6. පුනරුත්ථාපනය කරනු ලබන්නන්ගේ පුජා විද්‍යාත්මක ලක්ෂණ 108

6.1 නේවාසිකයන්ගේ අපරාධකාරී හැසිරීම 115

6.2 නේවාසිකයන්ගේ ආයතනගත පුනරුත්ථාපන ක්‍රියාවලිය 123

6.3 පුනරුත්ථාපනය වූවන්ගේ පසුභාර කටයුතු 132

7. පරිච්ඡේදය 140-148

7. සමාලෝචනය 141

7.1 නිගමන සහ යෝජනා 144

* ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 149

* ඇමුණුම 1 157

* ඇමුණුම 2 172

* ඇමුණුම 3 176

* ඇමුණුම 4 178

## වගු ලේඛණය


| අංකය | වගුවේ නම | පිටුව |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකාවේ ළමා සහ තරුණ වරදකරුවන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක ආයතනික ව්‍යුහ - 1956 | 81 |
| 2. | ශ්‍රී ලංකාවේ ළමා වරදකරුවන් සඳහා ඇති සහතික කළ පාසැල් ගණන 1979 - 1990 දක්වා | 82 |
| 3. | ආරම්භයේ සිට අවුරුදු කිහිපයක තරුණ වරදකරුවන් පුහුණු කිරීමේ පාසලට නේවාසිකයන් ඇතුළත් වී ඇති ආකාරය | 98 |
| 4. | මෑත අවුරුදු කිහිපයක තරුණ වරදකරුවන් පුහුණු කිරීමේ පාසලට නේවාසිකයන් ඇතුළත් වී ඇති ආකාරය | 98 |
| 5. | අදාල වර්ෂවල බන්ධනාගාරගත වූවන්ගේ වයස් කාණ්ඩ සහ එම ප්‍රමාණයන් | 99 |
| 6. | නේවාසිකයන් පුහුණු කාලය තුළ වර්ග කර ඇති ආකාරය | 102 |
| 7. | අදාල වර්ෂ කිහිපයක තරුණ වරදකරුවන් පුහුණු කිරීමේ පාසලේ නේවාසිකයන්ගේ නිෂ්පාදනවල වටිනාකම | 103 |
| 8. | නේවාසිකයන්ගේ සමාජ පසුබිම (ග්‍රාමීය හා නාගරික) - 1989 | 108 |
| 9. | නේවාසිකයන්ගේ ජනවාර්ගික නියෝජනය - 1989 | 108 |
| 10. | නේවාසිකයන්ගේ වයස් ව්‍යුහයන් සහ සංඛ්‍යාව - 1989 | 109 |

| | | |
|---|---|---|
| 11. | නේවාසිකයන්ගේ පෙර රැකියාවන්හි ස්වරූපය - 1989 | 110 |
| 12. | නේවාසිකයන්ගේ පවුල් පසුබිම - 1989 | 111 |
| 13. | නේවාසිකයන්ගේ දෙමාපියන්ගේ රැකියාවන් - 1989 | 111 |
| 14. | නේවාසිකයන්ගේ පවුල්වල ආදායම - 1989 | 112 |
| 15. | නේවාසිකයන්ගේ පෙර හැසිරීමේ ස්වභාවය - 1989 | 115 |
| 16. | නේවාසිකයන්ගේ පෙර වැරදි වලට ලැබී ඇති දඬුවම් | 117 |
| 17. | නේවාසිකයන්ගේ ආයතනගත වීමට මුල් වූ වරද - 1989 | 118 |
| 18. | පුනරුත්ථාපනය වූවන් ආයතනයේ විවිධ අංශවල පුහුණුව ලබා ඇති අන්දම - 1989 | 123 |
| 19. | පුනරුත්ථාපනය වූවන්ගේ විශේෂ දක්ෂතා සහ එම අංශ-1989 | 124 |
| 20. | ආයතනගත කාලය තුළ නේවාසිකයන්ගේ චරියාව පිළිබඳ නිලධාරින්ගේ තේරීම් - 1989 | 125 |
| 21. | නේවාසිකයා ඔහුගේ පවුල් ඒකකය සමග ගොඩනගාගෙන තිබූ සම්බන්ධතාවයේ ස්වරූපය - 1989 | 126 |
| 22. | පුනරුත්ථාපනය වූවන්ගේ වර්තමාන රැකියා | 135 |

# සටහන් ලේඛණය


| අංකය | සටහනේ නම | පිටුව |
|---|---|---|
| 1. | වතුපිටිවල තරුණ වරදකරුවන් පුහුණු කිරීමේ පාසලේ පරිපාලනමය ව්‍යුහය | 100 |
| 2. | නේවාසිකයන්ගේ දෛනික දින චර්යාව | 104 |
| 3. | පුනරුත්ථාපන ආයතනයක් සතු උපව්‍යුහයන් සහ එහි සංවිධානය | 129 |

# 1. පළමු පරිච්ඡේදය

1. පර්යේෂණ මාතෘකාව

1.1. පර්යේෂණයේ වැදගත්කම

1.2 පර්යේෂණ ගැටළුව සහ පරමාර්ථ

1.3 මූලාශ්‍ර භාවිතය සහ ක්‍රමවේදය

1.4 දත්ත විශ්ලේෂණය

# 1. පර්යේෂණ මාතෘකාව

## "ශ්‍රී ලංකාවේ පුනරුත්ථාපන නව උපාය මාර්ග පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්"

## 1.1. පර්යේෂණයේ වැදගත්කම

පර්යේෂණයක් සිදුකිරීමෙන් ඇති පල ප්‍රයෝජන මොනවාද යන්න සලකා බැලීමෙන් එහි ඇති වැදගත්කම කුමක්ද යන්න පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකි වේ. ඕනෑ ම පර්යේෂණයකින් ශාස්ත්‍රීය, කාලීන සහ ප්‍රායෝගික වැදගත්කමක් ගෙන දෙනු ඇත. මෙම පර්යේෂණයෙන් ද එවැනි ම වැදගත්කමක් ඇතැයි පෙන්වා දිය හැකිය.

ශාස්ත්‍රීය වශයෙන් ඇති වැදගත්කම කෙරෙහි අවධානය යොමුකිරීමේ දී කිව යුතු ප්‍රධානතම කරුණක් වන්නේ ශ්‍රී ලාංකික සමාජයේ පුනරුත්ථාපනය හෝ වෙනත් දඬුවම් ක්‍රම සම්බන්ධයෙන් සිදු කර ඇති ශාස්ත්‍රීය පර්යේෂණ දුර්ලභ බවයි. අපේ පැරණි දඬුවම් ක්‍රම සම්බන්ධ ව යම් තරමකින් හෝ අධ්‍යයනය කර ඇත්තේ විල්හෙල්ම් ගයිගර් (මධ්‍ය කාලීන ලංකා සංස්කෘතිය - 1969) සහ මහාචාර්ය රැල්ෆ් පීරිස් (සිංහල සමාජ සංවිධානය - මහනුවර යුගය - 1964) වැනි විද්වතුන් විසිනි. එහෙත් එම පර්යේෂණ දණ්ඩනය සම්බන්ධයෙන් ම අධ්‍යයනය කළ ඒවා නොවේ. එබැවින් දණ්ඩන ක්‍රම පිළිබඳව ම අධ්‍යයනය කළ පර්යේෂණ කෘති සොයා ගැනීම දුෂ්කරය. එසේ ම පුනරුත්ථාපනය වැනි දණ්ඩන ක්‍රමයක් ගැන සිදු කළ ක්ෂේත්‍ර පර්යේෂණ එතරම් හඳුනාගත නොහැකි යැයි පෙන්වාදිය හැකිය. *1 ඒ අනුව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නව දණ්ඩන ක්‍රමයක් ලෙස පුනරුත්ථාපනය ගැන පර්යේෂණයක් සිදු කිරීම ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන්නකි.

"පුනරුත්ථාපනය යනු සමාජ විරෝධි චර්යාව හා සම්බන්ධ පූර්වාංග හේතුන් හෙළිදරව් කරගත හැකි ඒ පිළිබඳ ව අවබෝධයක් ලබා දිය හැකි, චිකිත්සක කෘත්‍යයන් මාර්ගයෙන් වැරදිකරුවන් හට ප්‍රතිකාර කරන්නා වූ ඥාන සම්භාරය එම වැඩපිළිවෙල සහ විද්‍යාත්මක ලෙස හැසිරීම පාලනය කරන්නා වූ ක්‍රියාවලියයි." *2

---

*1. Silva, Manil - Bibliography on the Sri Lanka Child, 1979, International year of Child Secretariat, Sri Lanka.


*2. Dermot, Walsh - A Dictionary of Criminology, 1983
Andrian, Poole Routledge and Kegan Paul, London, P. p. 195 - 196

පුනරුත්ථාපනය සම්බන්ධයෙන් මෙවැනි නිර්වචනයක් ඉදිරිපත් කරන්නේ ප්‍රකට දණ්ඩනවේදියකු වන ප්‍රැන්සිස් ඒ. ඇලන්ය. මෙම නිර්වචනයෙන් කියවෙන්නේ යම් පුද්ගලයෙකුගේ සමාජ විරෝධි චර්යාව හා සම්බන්ධ පූර්ව හේතු හඳුනා ගනිමින් ඔහුගේ හෝ ඇයගේ හැසිරීම විද්‍යාත්මක ලෙස පාලනය කිරීමේ ක්‍රියාවලිය පුනරුත්ථාපනය ලෙස සැලකිය හැකි බවයි. මෙවැනි දණ්ඩන ක්‍රමයක් දණ්ඩනවේදියාට හා ඒ හා සම්බන්ධ විෂයන් වන අපරාධ විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විෂයන්ට වැදගත් වූයේ කෙසේ ද යන්න කෙටියෙන් විමසා බැලීම වැදගත්ය. දඬුවම පිළිබඳ සිද්ධාන්ත අතර පළිගැනීම සහ භය ගැන්වීම වැනි සිද්ධාන්තවලට ඇති වැදගත්කම අඩු වී එය චරිත ශෝධනයක් වශයෙන් යොදා ගැනීමට බොහෝ මානව සමාජ උත්සාහ කිරීමෙන් පුනරුත්ථාපන සංකල්පය වැදගත් විය. එය බටහිර සමාජ නවීකරණයන් සිදු වූ 17, 18 යන ශත වර්ෂවල බටහිර උගතුන් විසින් පෙන්වා දෙනු ලැබූවකි. එහෙත් පුනරුත්ථාපන සංකල්පය දකුණු ආසියාතික සමාජයට අලුත් සංකල්පයක් නොවේ. මහාචාර්ය නන්දසේන රත්නපාල තම "Crime and Punishment in the Buddhist Tradition - 1993" නැමැති කෘතියේ සඳහන් කර ඇති ආකාරයට බෞද්ධ සම්ප්‍රදායේ විනය නීති සහ එයට සම්බන්ධ දඬුවම් ක්‍රම ගොඩනැගී ඇත්තේ චරිත ශෝධනය නැමැති සිද්ධාන්තය මතය. එහි "පුනරුත්ථාපනය" ප්‍රධානතම දණ්ඩන ක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය. මෙම සම්ප්‍රදායන් ඉන්දියාවේ මෙන් ම ශ්‍රී ලංකාවේ ද භික්ෂු සංස්ථාව තුළ ක්‍රියාත්මක වී තිබේ. අවාසනාවකට මෙන් වර්තමාන භික්ෂු සංස්ථාව තුළ මෙම අංග එතරම් හොඳින් වර්ධනය වීමක් හෝ භාවිත වීමක් දැකිය හැකි නොවේ. අපගේ දණ්ඩන ක්‍රමවල විශාල වෙනසක් සිදු වුණේ යටත් විජිත යුගයේදීය. බන්ධනාගාර වැනි දඬුවම් ක්‍රම හොඳින් තහවුරු වූයේ මෙම අවධියේය. එයට හේතු වූයේ පසුගිය සියවස් එක හමාරකට පමණ පෙර බ්‍රිතාන්‍ය ඇතුළු බටහිර රටවල්හි ඇති වූ ආගමික ප්‍රතිසංස්කරණයන් ය. එය දණ්ඩනය වැනි ක්ෂේත්‍රවලට ද වැදගත් වූයෙන් දඬුවම් ක්‍රම ලිහිල් වී චරිත ශෝධනය වැදගත් විය. එය මත බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයේ අවසාන භාගයේ ශ්‍රී ලංකාවේ ද චරිත ශෝධනය නැමැති සිද්ධාන්තය දණ්ඩන ක්‍රමවලට ඇතුළත් විය. මේ වනවිට ශ්‍රී ලංකාවේ දණ්ඩන ක්‍රම අතරට පුනරුත්ථාපනය වැදගත් සංකල්පයක් වී තිබේ. බන්ධනාගාර කොමසාරිස්වරයා වන එච්.ජී. ධර්මදාස "The Asian Journal of Crime Prevention and Justice - No 8, 1990" නැමැති සඟරාවට ලිපියක් ලියමින් (The Problem of Imprisonment, Over Crowding of Prisons - The Search for Solutions) පෙන්වා දෙන්නේ ශ්‍රී ලාංකික බන්ධනාගාර සංවිධානය වී ඇත්තේ පුනරුත්ථාපනය නැමැති සංකල්පය මත බවයි. එමෙන් ම පුනරුත්ථාපනය දේශපාලන වැරදිකරුවන්, මත්ද්‍රව්‍ය වැරදිකරුවන්, ගණිකාවන්, බාලාපරාධකරුවන්, වීදි දරුවන්, අංගවිකල පුද්ගලයින්, මානසික රෝගීන් උදෙසා ද වැදගත් වී ඇත. මෙයින් පැහැදිලි වන්නේ පුනරුත්ථාපනය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම ශාස්ත්‍රීය වශයෙන් පමණක් නොව කාලීන වශයෙන් ද වැදගත් වී ඇති ආකාරයයි.

මෙම පර්යේෂණයේ ප්‍රායෝගික වැදගත්මක කුමක්ද යන්න සලකා බැලීම ද වැදගත් වේ. ශ්‍රී ලංකාවේ දණ්ඩන ක්‍රමවල වෙනස්වීම් සිදුවෙමින් පවතින බැවින්

## 1.2 පර්යේෂණ ගැටළුව සහ පරමාර්ථ

පර්යේෂණයක් සහ බුද්ධිමය ගැටළුවක් අතර ඇත්තේ ඉතාමත් ප්‍රබල සම්බන්ධතාවකි. ඒනිසා ම පර්යේෂකයකු තම කාර්යය ආරම්භ කිරීමට මූලික පදනම බවට පත් කර ගන්නේ යම් බුද්ධිමය ගැටළුවකට විද්‍යාත්මක ක්‍රමය ඔස්සේ පිළිතුරු සොයා යාම යැයි පැවසීම නිවැරදිය. එවැනි ගැටළුවකට පිළිතුරු සොයා ගැනීමේ දී අනුගමනය කළ යුතු විද්‍යාත්මක ක්‍රමවේදය සම්බන්ධයෙන් වර්තමානයේ පවතින ආකෘතිය මෙසේ පෙන්වා දිය හැකිය.




*1

මෙම විද්‍යාව පිළිබඳ චක්‍රය (Wheel of Science) වෝල්ටර් වොලස් (Walter Wallace) විසින් 1969 දී ගොඩනගන ලද්දකි. යම් ගැටළුවකට පිළිතුරු සොයා යාමේ දී ඒ හා සම්බන්ධ අවයව සහ විද්‍යාත්මක ක්‍රම වේදය කුමක් ද යන්න වටහා ගැනීමට මෙම ආකෘතිය වැදගත් වේ. මෙය තවදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රකාශය දෙස අවධානය යොමු කළ හැකිය. එනම්,

"ගවේෂණයක් හෝ පර්යේෂණයක් කරන්නේ යම් කිසි ප්‍රශ්නයකට හෝ ගැටළුවකට පිළිතුරක් සපයා ගැනීමේ බුද්ධිමය කුතුහලයකින් පෙළුන විටයි." *2 යනුවෙනි.

---

*1. Blumer, Martin - Sociological Research Methods, 1992
Macmillon Education Ltd, London, P. 21

*2. රත්නපාල, නන්දසේන- සමාජ විද්‍යා පර්යේෂණ මූලධර්ම, සෙවන මුද්‍රණය 1995, පිටු අංකය 03